Sinhalese

Australian Government
Attorney-General's Department

## ඕස්ට්‍රේලියාව සුරක්ෂිතව තබා ගනිමු.
## තොරතුරු ලබා දෙන්න.

## NATIONAL SECURITY HOTLINE
## 1800 1234 00

**පළපුරුදු දුරකථන ක්‍රියාකරුවන් සෑම ඇමතුමක්ම වැදගත් ලෙස සලකයි.**
**ඔබට නිර්නාමිකව සිටිය හැක.**

### ජාතික ආරක්ෂාව - සෑම තොරතුරක්ම උපකාරීවේ

අද අප හට මහජනතාවගෙන් ලැබෙන සෑම තොරතුරක්ම හෙට ඕස්ට්‍රේලියාව ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කර තබා ගැනීමට ඉතා අගනාවේ. බොහෝ විට ඉතාම විශාල වෙනසක් කරන්නේ ඉතාම කුඩා විස්තරය බව අමතක නොකරන්න. ඔබට සැක සහිත කිසියම් දෙයක් දැකීමට හෝ ඇසීමට ලැබුණු විට, කරුණාකර National Security Hotline අමතා තොරතුරු ලබා දෙන්න.

## National Security Hotline යනු කුමක්ද?

National Security Hotline**(1800 1234 00)** යනු ඕස්ට්‍රේලියාව තුල සිදුවිය හැකි ත්‍රස්තවාදී ක්‍රියා නිසි බලධාරීන් හට වාර්තා කිරීමට ඔබව සම්බන්ධ කරන නොමිළේ කථා කල හැකි දුරකථන අංකයකි. මෙම දුරකථන අංකය දිනකට පැය 24 ක් පුරාත් සතියකට දින 7 ක් පුරාත් ක්‍රියාත්මකවේ. තොරතුරු ලබාදීම වැදගත්වේ - අද අප හට මහජනතාවගෙන් ලැබෙන සෑම තොරතුරක්ම හෙට ඕස්ට්‍රේලියාව ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කර තබා ගැනීමට ඉතා අගනාවේ.

## National Security Hotline වෙත දැනුම් දිය යුත්තේ මොනවාද?

ත්‍රස්තවාදීන් විශ්වාස කරන්නේ විශ්මයන් මත වන බැවින් ත්‍රස්තවාදයේ සළකුණු සම්බන්ධ ස්ථිර ලැයිස්තුවක් මහජනතාව හට ලබාදීම සැමවිටම දුෂ්කර කරුණක් වනු ඇත. කෙසේවුවද, දේශීය සහ විදේශීය අත්දැකීම් මගින් අප විසින් බැලිය යුතු සළකුණු සම්බන්ධ අනතුරු හැඟවීමක් ලබාදේ. ඕස්ට්‍රේලියනු ආරක්ෂක සංවිධාන මගින් ඕස්ට්‍රේලියාව ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කර ගැනීමට උපකාර කිරීමට දැඩි ලෙස ක්‍රියා කරන අතර මෙම චිත්‍රය සම්පූර්ණ කිරීමට මහජනතාවට හැකියාව ඇත. අවදානයෙන් බැලිය යුතු කරුණු සම්බන්ධ උදාහරණ කිහිපයක් පමණක් මෙම පොත් පිංච මගින් ලබාදේ.

### රාජකාරි ගොඩනැගිලි හෝ වෙනත් වැදගත් යටිතල පහසුකම් අසාමාන්‍ය ලෙස වීඩියෝ පටිගත කිරීම හෝ ඡායාරූපගත කිරීම

ත්‍රස්තවාදීන් විසින් ඉලක්කයක් සම්න්ධ තොරතුරු රැස් කරන එක ක්‍රමයක් වන්නේ වීඩියෝ පටිගත කිරීමය. සැක සිතෙන ආකාරයට යම් අයෙකු වීඩියෝ කැමරාවක්, කැමරාවක් හෝ ජංගම දුරකථන කැමරාවක් පාවිච්චි කරන්නේ නම් (සහ ඔවුන් සංචාරකයන් ලෙස නොපෙනේ නම්) කරුණාකර ඒ බව වාර්තා කරන්න.

### වැදගත් ගොඩනැගිලි හෝ කලබලකාරී ප්‍රසිද්ධ ස්ථාන ආසන්නයේ ඇති සැක සහිත වාහන

ත්‍රස්තවාදීන් විසින් විවිධ අරමුණු සඳහා වාහන භාවිතා කල හැකි අතර මෙය නිරීක්ෂණ කටයුතු සිට බෝම්බ තැබීම යන කරුණු සඳහා විය හැක. සමහර අවස්ථාවල වාහන නතර කල නොහැකි ස්ථානද ඇතුළුව අසාමාන්‍ය ලෙස දිගු කාලයක් වාහන නවතා තැබිය හැක. පුපුරණ ද්‍රව්‍ය ඉතා බර විය හැකි බැවින් කාර් සහ වෑන් රථ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉතා අධික ලෙස පහත්වී තිබිය හැක. මෙවැනි වාහන ලියාපදිංචිය අවසන්වී හෝ ව්‍යාජ අංක තහඩු හෝ අංක තහඩු නොමැති ඒවා විය හැක.

### සැක සහිත ඉදුම්හිටුම් අවශ්‍යතා

සමහර අවස්ථාවල ත්‍රස්තවාදී ක්‍රියාවක් සම්බන්ධීකරණය කිරීමට කටයුතු කරන අවස්ථාවක ඔවුන් විසින් සැක සිතෙන ආකාරයට ඉදුම් හිටුම් භාවිතා කිරීම, කුලියට ගැනීම හෝ මිළට ගැනීම කල හැක. එංගලන්තයේ, කුලියට ගත් ගරාජයක් බෝම්බ කම්හලක් බවට පත්කර තිබුණි. මෙම ගරාජයෙන් එළියට සහ ඇතුලට යන අත්වැසුම් පැලද ගත් මිනිසුන් සම්බන්ධයෙන් යම් අයෙකු විසින් කරන ලද පැමිණිල්ලක් අනුව ත්‍රස්තවාදීන් අත්අඩංගුවට ගන්නා ලද අතර මොවුන් විසින් හීත්‍රෝ ගුවන් තොටුපලට ඒ වන විටත් තුන් වරක් පහරදී තිබිණ.

### රසායනික ද්‍රව්‍ය, පුපුරණ ද්‍රව්‍ය හෝ ආරක්ෂිත උපකරණ අසාමාන්‍ය ලෙස මිළට ගැනීම

ලෝකය පුරාම ත්‍රස්තවාදී පහරදීම්වලට රසායනික ද්‍රව්‍ය උපයෝගී කරගෙන ඇත. මෙම රසායනික ද්‍රව්‍ය ගෘහ, කෘෂිකාර්මික, පශු වෛද්‍ය, කාර්මික සහ රූපාලාවන්‍ය ආදී නිෂ්පාදනයන් සඳහා නිදහසේ ලබා ගත හැක. රසායනික ද්‍රව්‍ය සහ ආරක්ෂිත උපකරණ අසාමාන්‍ය ලෙස මිලට ගැනීම ඔබ දුටුවහොත්, National Security Hotline වෙත වාර්තා කරන්න.

### යම් දෙයක් මගින් කිසිවක් අදහස් නොවේනම්

ත්‍රස්තවාදී ක්‍රියාවක් කිරීමට අදහස් කරන අයෙකු අසාමාන්‍ය හෝ සැක කටයුතු ආකාරයට හැසිරිය හැක, එසේත් නැතිනම් ඔවුන් කිරීමට උත්සාහ කරන දෙය මගින් කිසිවක් අදහස් නොවිය හැක. කිසිවක් අදහස් නොවන හැසිරීමට උදාහරණයක් ඇමෙරිකාවේ සැප්තැම්බර් 11 ප්‍රහාරවලට සම්බන්ධවූ ත්‍රස්තවාදීන්ගෙන් දැකගත හැකි විය. ඔවුන් හට ගුවන් යානා පුහුණුව තිබුණද, ගුවන් යානයක් අහසට නැංවීම හෝ ගොඩබෑම සම්බන්ධව ඉගෙනීමට කිසිදු උනන්දුවක් නොවීය. යම් දෙයක් සැක සහිතද නැද්ද යන්න අවස්ථානුගත කරුණු අනුව වෙනස් විය හැක. අවස්ථාව දෙස සමස්තයක් ලෙස බලන්න. යම් අයෙකුගේ හැසිරීම සම්බන්ධයෙන් ඔබට කිසියම් සැකයක් ඇතිනම්, අංක 1800 1234 00 ඔස්සේ පැය 24 පුරා ක්‍රියාත්මක වන National Security Hotline (ජාතික ආරක්ෂක දුරකථන අංකය) අමතන්න.

### ව්‍යාජ හැඳුනුම්පත් හෝ හැඳුනුම්පත් කිහිපයක් තිබීම

ත්‍රස්තවාදී ක්‍රියාවක් සැලසුම් කරන අය බොහෝවිට ක්‍රෙඩිට් කාඩ්, ගමන් බලපත්‍ර සහ රියදුරු බලපත්‍ර ඇතුළු සොරකම් කරන ලද හෝ ව්‍යාජ ලියකියවිලි භාවිතා කරයි. ඔවුන් ලග හඳුනා ගැනීම සඳහා ලියකියවිලි කිහිපයක් තිබිය හැකි අතර ඔවුන් හමුවූ අය සම්බන්ධයෙන් පරස්පර විස්තර ලබාදිය හැක.

බොහෝ විට ඉතාම විශාල වෙනසක් කරන්නේ ඉතාම කුඩා විස්තරය බව අමතක නොකරන්න. ඔබට සැක සිතෙන දෙයක් ඔබ දුටුවහොත් හෝ එවැනි දෙයක් සම්බන්ධයෙන් ඔබ දන්නේ නම්, ඔබට හැකි තරම් තොරතුරු සටහන් කර ගන්න. බලධාරීන් හට උපකාර විය හැකි තොරතුරු අතර ලිපිනයන්, දිනයන්, වේලාවන්, දුරකථන අංක, වාහන අංක තහඩු සහ සවිස්තරාත්මක තොරතුරු ඇතුලත්වේ.

## සම්බන්ධවීම සඳහා විස්තර

ඔබට සැක සහිත කිසියම් දෙයක් දැකීමට හෝ ඇසීමට ලැබුණු විට, කරුණාකර National Security Hotline අමතා තොරතුරු පැතිර යාමට අවස්ථාව ලබා දෙන්න. බොහෝ විට ඉතාම විශාල වෙනසක් කරන්නේ ඉතාම කුඩා විස්තරය බව අමතක නොකරන්න.

| | |
|---|---|
| දුරකථනය: | **1800 1234 00** |
| ඊමේල්: | hotline@nationalsecurity.gov.au |
| වෙබ් අඩවිය: | australia.gov.au/nationalsecurity |